**ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව**
**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

# පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම

1957 අංක 49 දරණ රජයේ කාර්මික නීතිගත සංස්ථා පනතේ විධිවිධාන ප්‍රකාරව අංක 14853/3 දරණ රජයේ අති විශේෂ ගැසට් නිවේදනය මගින් 1969 දී ස්ථාපිත කර ඇති ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ පහත තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම්ලත් අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. ප්‍රධාන වෛද්‍ය නිලධාරි - ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණය (HM 1-1) - තනතුරු 01

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී පිළිබඳ ලබාගත් උපාධිය

සමඟ

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයෙහි වසර (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

## 02. සහකාර සාමාන්‍යාධිකාරී (කර්මාන්තශාලා) - ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණය (HM 1-1) - තනතුරු 01

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව / නිෂ්පාදන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිය.

සමඟ

අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නාවූ , පිළිගත් වරලත් වෘත්තිය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

රජයේ ,රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රෙය් වසර පහළොව (15 ) ක පළපුරුද්දක් ලබා තිබීම.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

## 03. සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි) - ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණය (HM 1-1) - තනතුරු 01

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අලෙවි කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය /ව්‍යාපාර කළමනාකරණය / වාණිජවේදී විෂයන්ගෙන් ලබාගත් උපාධිය

සමඟ

අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නාවූ , පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

රජයේ ,රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රෙය් වසර පහළොව (15 ) ක පළපුරුද්දක් ලබා තිබීම.

## 04. සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන) - ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණය (HM 1-1) - තනතුරු 01

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය/ නීතිය/ ව්‍යාපාර කළමනාකරණය/ රාජ්‍ය පරිපාලනය/ ව්‍යාපාර පරිපාලනය උපාධිය

සමඟ

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොව (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

## HM 1-1 සේවා ගණය සඳහා,

**සුදුසුකම්**

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 01 හෝ 02)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකරණ සේවා (MM) ගණයේ I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස**

අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලනොපායි.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

**වැටුප**

HM 1-1 - රු. 140,640 – 15 x 4,100 – 202,140/- වැටුප් පරිමාණයේ 2026.01.01 දිනට ආරම්භක වැටුප් පියවර වන රු. 123,019.00, රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහා ද හිමිකම් ලබනු ඇත.

2026.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 123,019/-

2027.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 140,640/-

**මීට අදාළ අමතර දීමනා**

- වෘත්තීය දීමනාව.
- ජීවන වියදම් දීමනාව.
- භාෂා ප්‍රවීණතා දීමනාව.
- ප්‍රවාහන දීමනාව.
- දුරකථන දීමනාව.
- වෙනත් දීමනා.

## 05. වෛද්‍ය නිලධාරි - කළමනාකාර සේවා ගණය (MM 1-3) - තනතුරු 01

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

1.විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී පිළිබඳ උපාධිය.

සහ

උපාධිය ලබාගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වසර 01 ක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 )**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2.“කණිෂ්ඨ කළමනාකාර” JM 1 – 1 සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රෙය් තනතුරක අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප**

MM 1-3 - රු. 96,650 – 10 x 2,480 – 15 x 3,450 - 173,200/- වැටුප් පරිමාණයේ 2026.01.01 දිනට ආරම්භක වැටුප් පියවර වන රු. 85,896.00, රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහා ද හිමිකම් ලබනු ඇත.

2026.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 85,896/-

2027.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 96,650/-

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

## 06. කළමණාකරු (කර්මාන්තශාලා) - කළමනාකාර සේවා ගණය (MM 1-1) - තනතුරු 01

**<u>සුදුසුකම්</u>**

**<u>බාහිර අයදුම්කරුවන්</u>**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් වසර 04 ක පූර්ණකාලීන විද්‍යාවේදී ඉංජිනේරු උපාධි ලබා තිබීම හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් වෙනත් සමාන අධ්‍යාපන සුදුසුකම් ලබා තිබීම.

සහ

2017 අංක 04 දරන පනත මගින් ස්ථාපිත ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ආශ්‍රිත ඉංජිනේරුවරයකු ලෙස ලියාපදිංචි වී තිබීම හා එසේ ලියාපදිංචි වීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

## 07. කළමණාකරු (පිරිවැය) - කළමනාකාර සේවා ගණය (MM 1-1) - තනතුරු 01

**<u>සුදුසුකම්</u>**

**<u>බාහිර අයදුම්කරුවන්</u> (පහත 1 හෝ 2 )**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද ව්‍යාපාර කළමනාකරණය/ ගණකාධිකරණය/ වාණිජ්‍යය/ ව්‍යාපාර පරිපාලනය/ මූල්‍ය කළමනාකරණය විෂයයන්ගෙන් ලබාගත් උපාධිය.

   සහ

   උපාධිය ලැබීමෙන් පසුව රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක පිරිවැය කරණයට අදාළ මාණ්ඩලික මට්ටමේ තනතුරක යටත් පිරිසෙයින් වසර 01 ක පළපුරුද්ද ලබා තිබීම.

2. ශ්‍රී ලංකා වරලත් වෘත්තීය ආයතනයක අන්තර්මධ්‍යම පරීක්ෂණය (Intermediate Level) සමත්වීම.

   සහ

   එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ගණකාධිකරණය හෝ මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයට අදාළ මාණ්ඩලික මට්ටමේ තනතුරක යටත් පිරිසෙයින් වසර 01 ක පළපුරුද්ද ලබා තිබීම.

**<u>MM 1-1 සේවා ගණය සඳහා,</u>**

**<u>සුදුසකම්</u>**

**<u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u> (පහත 1 හෝ 2 )**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. "කණිෂ්ඨ කළමනාකාර" JM 1 – 1 සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රෙය් තනතුරක අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

**වයස.**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප**

MM 1-1 - රු. 91,690 – 10 x 2,480 - 15 x 3,450 – 168,240/- වැටුප් පරිමාණයේ 2026.01.01 දිනට ආරම්භක වැටුප් පියවර වන රු. 81,710.00, රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහා ද හිමිකම් ලබනු ඇත.

2026.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 81,710/-

2027.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 91,690/-

## 08. සහකාර කළමනාකරු (අලෙවි ප්‍රවර්ධන) - කණිෂ්ඨ කළමනාකාර සේවා ගණය (JM 1-1) - තනතුරු 02

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කළමනාකරණ/ අලෙවිකරණ/ වාණිජ්‍යය උපාධියක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යාස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අලෙවිකරණ ක්ෂේත්‍රයේ වසර දෙකක (02) සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA 1-1) සේවා ගණයෙහි II ශ්‍රේණියේ අලෙවි ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

## 09. තාක්ෂණ නිලධාරි (යාන්ත්‍රික/ විදුලි) - කණිෂ්ඨ කළමනාකාර සේවා ගණය (JM 1-1) - තනතුරු 01

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් (පහත 01 හෝ 02 හෝ 03 හෝ 04 හෝ 05)**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු විද්‍යා විශේෂායන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.
2. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (යාන්ත්‍රික හෝ විදුලි) (NDT) ලබා තිබීම.
3. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන් හී N.V.Q. හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු පිළිගත් ආයතනයක යාන්ත්‍රික හෝ විදුලි ක්ෂේත්‍රයේ වසර දෙකක (02) සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුය.

4. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන් හී N.V.Q. හයවැනි (06) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර පහක (05) සේවා පළපුරුද්ද ලබා තිබීම.

5. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන් හී N.V.Q. පස්වැනි (05) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර දහයක (10) සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 01 හෝ 02)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකරණ සහකාර තාක්ෂණ (MA 2-1) සේවා ගණයෙහි ii ශ්‍රේණියේ යාන්ත්‍රික/ විදුලි ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

## 10. තත්ත්ව පාලන නිලධාරී - කණිෂ්ඨ කළමනාකාර සේවා ගණය (JM 1-1) - තනතුරු 01

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් රසායන විද්‍යා/භෞතික විද්‍යා/ජීව විද්‍යා /ආහාර තාක්ෂණ උපාධියක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබාගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක , මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක රසායනාගාරයක අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක සේවා පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 01 හෝ 02)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA 1-1) සේවා ගණයෙහි II ශ්‍රේණියේ තත්ත්ව පාලන ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**JM 1-1 සේවා ගණය සඳහා**

**වයස**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාවක් අදාළ නොවේ.

**වැටුප**

JM 1-1 - රු. 72,650 – 10 x 1,360 – 18 x 2,040 – 122,970/- වැටුප් පරිමාණයේ 2026.01.01 දිනට ආරම්භක වැටුප් පියවර වන රු. 65,633.00, රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහා ද හිමිකම් ලබනු ඇත. (කළමනාකරණ සේවා 01/2025 චක්‍රලේඛනයට අදාළව.)

2026.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 65,633/-

2027.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 72,650/-

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

## 11. තාක්ෂණ සහකාර (විදුලි) - කළමනාකරණ සහකාර - තාක්ෂණ සේවා ගණය (MA 2-1) - තනතුරු 01

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

තනතුරට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා N.V.Q. පහ (05) මට්ටමට නොඅඩු මට්ටමක විදුලි කාර්මික තාක්ෂණ පාඨමාලාවක් හදාරා ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

පිළිගත් ආයතනයක විදුලි කාර්මික ශිල්පියකු ලෙස අවම වශයෙන් දෑ අවුරුදු සේවා කාලයක් සපුරා ප්‍රායෝගික පළපුරුද්ද ලබා තිබිම අතිරේක සුදුසුකමක් ලෙස සළකනු ලැබේ.

## 12. තාක්ෂණ සහකාර (යාන්ත්‍රික) - කළමනාකරණ සහකාර - තාක්ෂණ සේවා ගණය (MA 2-1) - තනතුරු 01

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

තනතුරට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා N.V.Q. පහ (05) මට්ටමට නොඅඩු මට්ටමක යාන්ත්‍රික තාක්ෂණ පාඨමාලාවක් හදාරා ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

පිළිගත් ආයතනයක යාන්ත්‍රික ශිල්පියකු ලෙස අවම වශයෙන් දෑ අවුරුදු සේවා කාලයක් සපුරා ප්‍රායෝගික පළපුරුද්ද ලබා තිබිම අතිරේක සුදුසුකමක් ලෙස සළකනු ලැබේ.

## 13. පොත් තබන්නා - කළමනාකරණ සහකාර - තාක්ෂණ සේවා ගණය (MA 2-1) - තනතුරු 01

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

තනතුරට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා මූල්‍ය / ගිණුම්කරණ / ගණකාධිකරණ / වාණිජ්‍යය පිළිබඳ ජාතික වෘත්තීය කුසලතා N.V.Q. පහ (05) මට්ටමට නොඅඩු මට්ටමක උසස් අධ්‍යාපන පාඨමාලාවක් හදාරා ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

පිළිගත් ආයතනයක පොත්තබන්නාගේ රාජකාරි පිළිබඳ අවම වශයෙන් දෑ අවුරුදු සේවා පළපුරුද්ද ලබා තිබිම අතිරේක සුදුසුකමක් ලෙස සළකනු ලැබේ.

**MA 2-1 සේවා ගණය සඳහා,**

**සුදුසකම්**

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

**වයස**

අවු.18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවෙකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

**<u>වැටුප</u>**

MA 2-1 - රු. 50,540 – 10 x 540 – 7 x 630 – 4 x 890 – 20 x 1,190 = 87,710/- වැටුප් පරිමාණයේ 2026.01.01 දිනට ආරම්භක වැටුප් පියවර වන රු. 46,960.00, රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහා ද හිමිකම් ලබනු ඇත. (කළමනාකරණ සේවා 01/2025 චක්‍රලේඛනයට අදාළව.)

2026.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 46,960/-

2027.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 50,540/-

Gazette.lk AMBITIONS REALIZED

## 14. කළමනකාරණ සහකාර (ඇසුරුම් පරීක්ෂක) - කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණය (MA 1-1) - තනතුරු 01

**<u>සුදුසුකම් (අනිවාර්ය පොදු සුදුසුකම්)</u>**

**<u>බාහිර අයදුම්කරුවන්</u>**

<u>අධ්‍යාපන</u>

(අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී

I. සිංහල/ දෙමළ
II. ගණිතය
III. ඉංග්‍රීසි භාෂාව (තත් කාර්යභාරය අනුව අවශ්‍ය වන්නේ නම් පමණක්)

**යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.**

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ඇ) තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම් :-

ඇසුරුම් කරණය පිළිබඳ පිළිගත් ආයතනයක පාඨමාලාවක් හදාරා තිබීම සහ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද තිබීම.

සහ

(පරිගණක වදන් සැකසුම/ යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන් අදාළ අවස්ථාවන්හි දී සුදුසුකම් වශයෙන් ඇතුළත් කරනු ලැබිය හැක.)

## 15. ස්ථානභාර නිලධාරි (ගබඩා/ අලෙවි මධ්‍යස්ථාන) - කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණය (MA 1-1) - තනතුරු 04 – (දීප ව්‍යාප්තව පවතින ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ අලෙවි සැල් සහ ගබඩා සඳහා අනුයුක්ත කරනු ලැබේ.)

**<u>සුදුසුකම් (අනිවාර්ය පොදු සුදුසුකම්)</u>**

**<u>බාහිර අයදුම්කරුවන්</u>**

<u>අධ්‍යාපන</u>

(අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී

I. සිංහල/ දෙමළ
II. ගණිතය
III. ඉංග්‍රීසි භාෂාව (තත් කාර්යභාරය අනුව අවශ්‍ය වන්නේ නම් පමණක්)

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

**යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.**

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ඇ) තනතුරට විශේෂිත වෙනත් අවශ්‍යා සුදුසුකම් :-

රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ගබඩාකරණය පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම සහ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද තිබීම.

සහ

(පරිගණක වදන් සැකසුම/ යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන් අදාළ අවස්ථාවන්හි දී සුදුසුකම් වශයෙන් ඇතුළත් කරනු ලැබිය හැක.)

## 16. ස්ථානභාර නිලධාරී ( ඔසු උයන්) - කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණය (MA 1-1) - තනතුරු 01

**<u>සුදුසුකම් (අනිවාර්ය පොදු සුදුසුකම්)</u>**

**<u>බාහිර අයදුම්කරුවන්</u>**

<u>අධ්‍යාපන</u>

(අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී

I. සිංහල/ දෙමළ
II. ගණිතය
III. ඉංග්‍රීසි භාෂාව (තත් කාර්යභාරය අනුව අවශ්‍යා වන්නේ නම් පමණක්)

**යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.**

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ඇ) තනතුරට විශේෂිත වෙනත් අවශ්‍යා සුදුසුකම් :-

කෘෂිකර්මය පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම. (උසස් පෙළ කෘෂි විද්‍යා අංශයෙන් සමත් අයට අදාළ නොවේ.)

සහ

(පරිගණක වදන් සැකසුම/ යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන් අදාළ අවස්ථාවන්හි දී සුදුසුකම් වශයෙන් ඇතුළත් කරනු ලැබිය හැක.)

**<u>MA 1-1 සේවා ගණය සඳහා,</u>**

**<u>සුදුසුකම්</u>**

**<u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u>**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයෙහි පහත ‘ආ’ , ‘ඇ’ සහ ‘ඉ’ සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී

I. සිංහල/ දෙමළ
II. ගණිතය
III. ඉංග්‍රීසි භාෂාව (තත් කාර්යභාරය අනුව අවශ්‍ය වන්නේ නම් පමණක්)

**යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.**

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**<u>සටහන්</u>**

යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තාවූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තා වූ පුහුණු වීමේ කාල පරිච්ඡේදයක් ඉහත "ඉ" ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/ අනියම් සේවා කාල පරිච්ඡේදය ඉහත "ඉ" ඡේදයෙහි සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

**<u>වයස</u>**

අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**<u>වැටුප</u>**

MA 1-1 -රු. 46,220 – 10 x 540 – 7 x 630 – 4 x 890 – 20 x 1,190 – 83,390/- වැටුප් පරිමාණයේ 2026.01.01 දිනට ආරම්භක වැටුප් පියවර වන රු.43,312.00, රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහා ද හිමිකම් ලබනු ඇත. (කළමනාකරණ සේවා 01/2025 චක්‍රලේඛනයට අදාළව.)

2026.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 43,312/-

2027.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 46,220/-

## 17. රියදුරු - ප්‍රාථමික ශිල්පීය සේවා ගණය (PL-3) - තනතුරු 03

**<u>සුදුසුකම්</u>**

**<u>බාහිර අයදුම්කරුවන්</u>**

අධ්‍යාපන සුදුසුකම්:

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවකරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) ක් සහිතව විෂයයන් හයකින් (06) කින් සමත් වීම.

ප්‍රවීණතා:

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ "ඩී" කාණ්ඩයේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. මෝටර් රථ රියැදුරන් බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

**<u>අභ්‍යන්තර අයදුම්කරුවන්</u>**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ "ඩී" කාණ්ඩයේ බර වාහන මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. මෝටර් රථ රියැදුරන් බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

සහ

ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

**වයස**

අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප**

PL 3 -රු. 43,280 – 10 x 490 – 10 x 540 – 10 x 590 – 12 x 630 – 67,040/- වැටුප් පරිමාණයේ 2026.01.01 දිනට ආරම්භක වැටුප් පියවර වන රු.40,834.00, රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහා ද හිමිකම් ලබනු ඇත. (කළමනාකරණ සේවා 01/2025 චක්‍රලේඛනයට අදාළව.)

2026.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 40,834/-

2027.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 43,280/-

## 18. යන්ත්‍ර ක්‍රියාකරු - ප්‍රාථමික -අර්ධ ශිල්පීය සේවා ගණය (PL-2) - තනතුරු 03

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් යන්ත්‍ර හා යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳ නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතාව (N.V.Q.) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

## 19. බොයිලර් ක්‍රියාකරු - ප්‍රාථමික -අර්ධ ශිල්පීය සේවා ගණය (PL-2) - තනතුරු 01

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් බොයිලර් ක්‍රියාකරවීම පිළිබඳ නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතාව (N.V.Q.) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**PL-2 සේවා ගණය සඳහා,**

**සුදුසුකම්**

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. අදාළ ක්ෂේත්‍රයෙහි වසර පහ (05) පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින්/ වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන වෘත්තීය පරීක්ෂණයක (Trade Test) දී තහවුරු කෙරෙන ජාතික වෘත්තීය කුසලතාව (N.V.Q.) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතාවය සහිත ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක සේවකයින්.

2. තනතුරට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

**වයස**

අවුරුදු 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප**

PL-2 -රු. 42,300 – 10 x 490 – 10 x 540 – 10 x 590 – 12 x 630 – 66,060/- වැටුප් පරිමාණයේ 2026.01.01 දිනට ආරම්භක වැටුප් පියවර වන රු.40,008.00, රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහා ද හිමිකම් ලබනු ඇත. (කළමනාකරණ සේවා 01/2025 චක්‍රලේඛනයට අදාළව.)

2026.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 40,008/-

2027.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 42,300/-

## 20. රිය සහායක - ප්‍රාථමික -ශිල්පීය නොවන සේවා ගණය (PL-1) - තනතුරු 01

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම.

## 21. නිෂ්පාදන සහායක/ අලෙවි සහායක - ප්‍රාථමික -ශිල්පීය නොවන සේවා ගණය (PL-1) - තනතුරු 04

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම.

**PL-1 සේවා ගණය සඳහා,**

**වයස**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප**

**PL-1** -රු. 40,500 – 10 x 450 – 10 x 490 – 7 x 540 – 15 x 590 – 62,530/- වැටුප් පරිමාණයේ 2026.01.01 දිනට ආරම්භක වැටුප් පියවර වන රු.38,488.00, රජයේ අනුමත දීමනා සහ සංස්ථාව විසින් දෙනු ලබන දීමනා සඳහා ද හිමිකම් ලබනු ඇත. (කළමනාකරණ සේවා 01/2025 චක්‍රලේඛනයට අදාළව.)

2026.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 38,488/-

2027.01.01 දිනට හිමි ආරම්භක වැටුප - රු. 40,500/-

**පොදු කරුණු**

**සෑම අයදුම්කරුවෙක්ම,**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය,**

I. පත්වීම් බලධාරියා විසින් පත් කෙරෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත/ වෘත්තීය සම්මුඛ පරීක්ෂණයක් මගින් සංස්ථාවේ බඳවා ගැනීමේ පරිපාටියට අනුව බඳවාගනු ලැබේ.

II. සේවක අර්ථසාධක අරමුදලට පත්වීම්ලාභීන්ගෙන් 8% ක් ද සේවා යෝජකයාගෙන් 12% ක් වශයෙන් දායක මුදල් ගෙවනු ලැබේ. ඊට අමතරව සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට පත්වීම්ලාභියාගේ වැටුපෙන් 3% කට සමාන මුදලක් ගෙවනු ලැබේ.

**අයදුම් කළ යුතු ආකාරය,**

I. ඉහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමේ දී සළකා බලනු ලබන සුදුසුකම් හා ඊට අදාළ සියලු විස්තර ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ **www.sladc.lk** යන නිල වෙබ් අඩවියට ප්‍රවේශ වීමෙන් ලබාගත හැකිය.

II. පුවත්පත් දැන්වීමට අනුව නිල වෙබ් අඩවියේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කර සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය මගින් තනතුර සඳහා අයදුම් කළ යුතු අතර, අයදුම් පත්‍රයේ සඳහන් සුදුසුකම් සනාථ කිරීමේ සහතික පත්‍රවල සහතික කළ ඡායා පිටපත් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු වේ.

III. රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් ස්වකීය ආයතනවල ප්‍රධානීන්ගේ මාර්ගයෙන් යොමු කළ යුතුය.

IV. අයදුම්පත් බහා එවන කවරයේ ඉහළ වම් කෙලවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

V. ඉහත තනතුරු කිහිපයකට අයදුම් කරන්නේ නම් වෙන වෙනම අයදුම්පත් යොමු කළ යුතුය.

VI. අයදුම්පත් භාරගැනීම 2026.10.06 දිනෙන් අවසන් වන අතර, නිසි පරිදි අයදුම් කරන ලද අයදුම්පත් එදිනට හෝ එදිනට පෙර **සභාපති, ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව, අංක 94, පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම.** යන ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන්** එවිය යුතුය.

VII. තවද ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ, මූලික සුදුසුකම් සපුරා නොමැති හා මූලික සුදුසුකම් සපුරා ඇති බවට සහතික පිටපත් මගින් සනාථ කර නොමැති, නිසි පරිදි ඉදිරිපත් නොවූ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

VIII. තැපෑලෙන් අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳ අප සංස්ථාව වගකියනු නොලැබේ.

සැ.යු - අයදුම්පත් බාරගන්නා අවසන් දිනය හෝ ඉහත බඳවා ගැනීමට අදාළ වෙනත් කරුණක් සම්බන්ධයෙන් යම් සංශෝධනයක් සිදුවුවහොත් නිල වෙබ් අඩවියේ ඒ බව යාවත්කාලීන කරනු ඇත.

**සභාපති,**
**ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව,**
**නාවින්න, මහරගම**
**2026.09.23**

ගීතාමනි සී.කරුණාරත්න,
සභාපති,
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED